**පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරය - 2021**

**------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණ කළමනාකරණ භාරයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයසහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට භාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, භාරයයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වටිනාකම රු. 1,347,223 ක්වූ ලී බඩු හා සවිකිරීම් හා කාර්යාලීය උපකරණ ඉකුත් වර්ෂයේ දී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද මේ දක්වා එම වත්කම් පාවිච්චි කරන බැවින් රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි ඡේද අංක 42 ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම් වලට ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ලී බඩු හා සවිකිරීම්වල ජීවකාලය අවසන් වූ පසු එහි අගය වැඩිවීමක් සිදු වී නැතැයි අපේක්ෂිත බැවින් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර දක්වා නැති බව. | සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද මේ දක්වා පාවිච්චි කරන වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අපජල පිරිපහදු යන්ත්‍රාගාරය සියයට 5 ක් බැගින් ක්ෂය කිරීමට තීරණය කර තිබුණ ද 2011 වර්ෂයේ ඉදිකරන ලද පිරිපහදු යන්ත්‍රාගාරය නැවත මුළුමනින්ම අලුතින් ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේ දී රු.මිලියන 114 කට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව වර්ෂ 20 ක් ලෙස ජීව කාලය සලසා සියයට 5 ක් බැගින් ක්ෂය කළ පිරිපහදු යන්ත්‍රාගාරය වසර 10 කින් මුළුමනින් අලුත්වැඩියා කිරීමට සිදුවීම හේතුවෙන් | ක්ෂය ප්‍රතිපත්තිය තීරණය කරන විට වසර 20කට වැඩි ජීව කාලයක් ඇතිව 5% බැගින් ක්ෂය කිරීමට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්ත ද යන්ත්‍රාගාරයේ ධාරිතාව ප්‍රමාණවත් නොවීම සහ නඩත්තු කටයුතුවල දුෂ්කරතාවය නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බව. | වත්කමේ ජීවකාලය නිවැරදිව තීරණය කර අනුගමනය කරනු ලබන ක්ෂය ප්‍රතිපත්තීන් හඳුනාගත යුතුය. |

අනුගමනය කරන ලද ක්ෂය ප්‍රතිපත්තීන් ප්‍රමාණවත් නොවුණි.

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ඔක්තෝබර් හා දෙසැම්බර් මාසවලදී කෙටි කාලීනව ආයෝජන වටිනාකම රු 76,122,535.කට සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු පොලී ආදායම රු.1,202,714ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කෙටි කාලීනව ආයෝජන සඳහා ලද හා ලැබිය යුතු පොලී සටහන්වල දක්වා ඇති බව. | ලැබිය යුතු පොලී ආදායම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | භාර ඔප්පුවට අනුව රු.1,700,000,000 ක් වටිනා ගොඩනැගිලි සංකීර්ණය භාරයට 2010 අගෝස්තු 10 දින පවරා දී තිබුණි. එහෙත් එම වටිනාකම රු.1,688,741,540 ක් ලෙස ගිණුම්ගත කර තිබූ බැවින් රු.11,258,460 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එම වටිනාකම සඳහා ක්ෂය ගණනය කර නොතිබුණි. | භාර ඔප්පුවේ දක්වා ඇත්තේ ගොඩනැගිලි වටිනාකම රු.1,700,000,000 ක් පමණ යනුවෙනි. ඒ අනුව භාර ඔප්පුවේ එම වටිනාකම ආසන්න බිලියනයට වැටයීම් කර දක්වා ඇති බැවින් මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි වටිනාකම නිවැරදිව දක්වා ඇති බව. | ගොඩනැගිලි වටිනාකම නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස (අඩුවීම)/ වැඩිවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | |
| (අ) | ණයගැතියෝ | **76,577,311** | **77,222,311** | **(645,000)** | මූල්‍ය ප්‍රකාශයේ සඳහන් අගය නිවැරදි වන බවත් ණයගැති කාලවිශ්ලේෂණ යේ එම අගය අඩුවිය යුතු බව. | මූල්‍ය ප්‍රකාශන හා වාර්තා අතර වටිනාකම් සසඳා වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි අගය ගිණුම්ගත කළ යුතුය. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | ලැබිය යුතු වෙළඳසැල් කුළී ආදායම | **7,110,807** | **15,212,466** | **(8,101,659)** | -එම- | -එම- |
| (ඇ) | කුළී ආදායම | **98,073,755** | **94,502,088** | **3,571,667** | -එම- | -එම- |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | සුළු මුදල් ගෙවීම් | 750,111 | බිල්පත් | එම තොරතුරු ලබාදෙන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | සුළු මුදලින් කළ ගෙවීම්වලට අදාල බිල්පත් වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | තාවකාලිකව ගෙවීම් නවතන ලද තැන්පතු | 5,550,000 | ශේෂ සනාථ කෙරෙන ලියවිලි | 2021 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ද මෙම තැන්පතු 3 ශේෂයන්ගේ කේවල ලැයිස්තුවක් ඉදිරිපත් කර ඇත. මෙම කේවල ලැයිස්තුව අවශ්‍ය ආකාරය පිළිබඳ ආකෘතියක් ලබාදෙන්නේ නම් ඒ අනුව එම තොරතුරු ලබාදීමට ද හැකියාව ඇති බව. | ශේෂ සනාථ කෙරෙන ලියකියවිලි ඉදිරිපත් කළ යුතු යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවලට අදාලව අයවිය යුතුව පැවති හිඟ ශේෂයෙන් අයකරගත් මුදල ලෙස රු.4,831,927 ක් ලෙජරයේ කුළී ආදායම් ගිණුමේ දක්වා ඇතත් එයට අදාල උපලේඛනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු හෙයින් අයකරගත් අයගේ විස්තර හා හිඟ ශේෂය පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේ දී මෙවැනි ලේඛනයක් සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | අදාල උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ඉදිරිපත් කරන ලද ණයගැති විශ්ලේෂණය අනුව 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 ඉක්මවූ රු.43,398,322 ක හිඟ ශේෂයක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | දිගු කාලයක් තිස්සේ අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------------------- | ------------------ | ----------------------- | --------------- |
| (අ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ IX වැනි පරිච්ඡේදයේ 120 ඡේදය | රජයේ නිලධාරියෙක් තනතුරක වැඩ බැලීම සඳහා හෝ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා හෝ පත්කළ යුත්තේ එම තනතුර එම රජයේ නිලධාරියා දැනට දරන තනතුරට වඩා ඉහළ තත්ත්වයේ තනතුරක් හෝ සම තත්ත්වයේ තනතුරක් වන්නේ නම් පමණි.එසේ වුවද භාරයේ ගණකාධිකාරි තනතුරේ වැඩ බැලීම සඳහා ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ප්‍රධාන ගණකාධිකාරිවරයා පත්කර සමාලෝචිත වර්ෂය සඳහා භාරය විසින් රු.360,000 ක් ගෙවා තිබුණි. | කළමනාකරණ භාරය වෙත කළමනාකරු සහ ගණකාධිකාරි තනතුරු සඳහා අලුතින් බඳවා ගැනීමට වඩා ධීවර අමාත්‍යාංශයේ එම තනතුරෙහි සේවය කරනු ලබන අමාත්‍යාංශ නිලධාරීන් පත්කිරීම මඟින් පලපුරුදු හා කාර්යක්ෂම සේවාවක් ඉටුකරවා ගැනීමට හැකි වන අතර එමඟින් අඩුපිරිවැයකින් අදාල සේවාවන් ඉටුකරවා ගැනීමට කලමනාකරණ භාරයට හැකි වී ඇති බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i | මුදල් රෙගුලාසි 261(1) | සියලුම ගෙවීම් මුදල් පොතෙහි හා ඒ සඳහා නියමිත වෙනත් ගිණුම් පොත්වල යථා පරිදි සටහන් කළ යුතු අතර මුදල් පොතේ සටහන්වලට අනුක්‍රමික ලෙස අංක යොදා සටහන්වලට අදාළ වවුචර්වලට ද එම අංක යෙදිය යුතුය යන්න සඳහන් වුවත් ඒ අනුව භාරයේ මුදල් පොත හා වවුචර් පිළියෙල කර නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි 446(2) ප්‍රකාරව ගෙවීම් සම්බන්ධ වගකිව යුතු අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියා විසින් මුදල් පොත අත්සන් කළ යුතුය යන්න සඳහන් වුවත් භාරයේ මුදල් පොත් සටහන් හා ශේෂයන් එසේ නිවැරදි බවට සනාථ කර ද නොතිබුණි. | මුදල් පොත නිවැරදිව පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii | මුදල් රෙගුලාසි 272(1) | ගෙවූ සියලුම වවුචර් ඒවායේ අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට විගණනය සඳහා අවශ්‍ය කරුණු සම්පූර්ණ කොට සුදානම් කර ඉදිරිපත් කළ යුතු වුවත් භාරය විසින් 2021 වර්ෂයේ ගෙවීම් වවුචර් අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට විගණනය සඳහා අවශ්‍ය කරුණු සම්පූර්ණ කොට ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවීම් වවුචර් නිවැරදිව පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ | | | |
| (i) | මුදල් රෙගුලාසි 876(3) ඡේදය | ව්‍යාවස්ථාපිත නොවන කිසියම් අරමුදලක් තවදුරටත් පවත්වාගෙන යාමට | මීට අදාල කමිටුවක් පත්කර ඉදිරි කටයුතු කරගෙන යනු ලබන | මුදල් රෙගුලාසිය ප්‍රකාරව පාර්ලිමේන්තු |

| | | | | |
|---|---|---|---|---|
| | | සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නිතීගත කිරීමට හැකිවන පරිදි අදාළ හේතු දක්වමින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළයුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනවන විටත් භාරය පාර්ලිමේන්තු පනතක් මඟින් ව්‍යාවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | අතර කඩිනමින් එම කටයුතු නිම කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන බව. | පනතක් මඟින් ව්‍යාවස්ථාපිත ආයතනයක් බවට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 877(2)(ඇ)ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී මාස 2 ක් ඇතුළත ඒ ඒ මුදල් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාවක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාට ද පිටපතක් සහිතව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2021 මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 14 දින ඉදිරිපත් කර තිබුණද මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී දින 14 ක ප්‍රමාදයක් සිදු වූ බව. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2010 අගෝස්තු 10 දිනැති භාර ඔප්පුව | | | |
| (i) | අංක 6(අ) 1 ඡේදය | භාරයේ සියලුම අතිරික්ත අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල, ආණ්ඩුවේ සුරැකුම්පත්වල හැර වෙනත් යම් ආකාරයකින් ආයෝජනය කිරීමට භාණ්ඩාගාරයේ පූර්ව ලිඛිත එකඟතාවයක් ලබාගත යුතු වුවත් එවැනි එකඟතාවයක් නොමැතිව කළමනාකරණ භාරය විසින් භාරකාර මණ්ඩලයේ තීරණයන් මත පමණක් එකතුව රු.298,981,972 ක මුදලක් ලංකා බැංකුවේ හා ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජනය කර තිබුණි. | කළමනාකරණ භාරයේ ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කර ඇත්තේ භාරයේ අනුමැතියට යටත්ව වන අතර එය පරිශ්‍රයේ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු වලදී අවශ්‍ය අවස්ථාවලදී ඉක්මණින් හා පහසුවෙන් ලබාගත හැකි ක්‍රමය මෙය වන බැවින් එම ක්‍රමය භාවිතා කර ඇති බව | භාර ඔප්පුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අංක 7(අ) | වෙළඳ ඒකකයක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබා ගනු ලබන තක්සේරුව පදනම් කොටගෙන තීරණය කරනු ලබන බදු කුලියක් තොග වෙළඳුන්ගෙන් හා සිල්ලර වෙළඳුන්ගෙන් අයකර ගත යුතු වුවත් දැනට අයකරනු ලබන රු.40,000 ක් හා රු.10,000 ක්වූ බදු කුලිය එකී නියමයට පටහැනිව සිදුකර තිබුණ ද ඒවා නිවැරදි කිරීමට වසර 11 ක් ගත වී ඇතත් කටයුතු කර නොතිබුණි. | හාරයේ ගොඩනැගිලි සම්බන්ධයෙන් තක්සේරු වාර්තාව ලද විගස වෙළඳසැල්වල බදු කුලී වෙනස් කිරීමට කටයුතු කරන බව. | හාර ඔප්පුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | අංක 7(ඉ) | හාරයට අයත් තොග වෙළඳසැල් 154 ක් හා සිල්ලර වෙළඳසැල් 128 ක් බදු දීම සඳහා හාර මණ්ඩලය විසින් අනුමත ලිඛිත නිර්ණායක සකස් කළ යුතු වුවත් එබඳු නිර්ණායක සකස් නොකර 2011 වර්ෂයේ සිට 2021 දක්වාම බදුදීම සිදුකර තිබුණි. | තොග වෙළඳ කුටි 2011 වසරේ තිස් අවුරුදු බදු පදනම මත ලබා දී ඇති අතර එය බදු පදනම අවසන් වූ පසු එම කාලවකවානුවේ පවතින උචිතම ක්‍රමවේදයට අනුව වෙළඳ කුටි ලබාදීම සිදුකරන බවත් සිල්ලර අංශයේ වෙළඳ කුටි ලබාදීම පොරොත්තු ලේඛනයක් යටතේ සිදුකරන බව. | -එම - |
| (iv) | අංක 7(ග) | හාරයේ දේපල ආරක්ෂා කරගැනීම සඳහා නඩු පැවරීමට හෝ නඩුවල දී විත්ති වාචික ඉදිරිපත් කිරීමට හැකි බව දක්වා තිබුණ ද 2011 වර්ෂයේ සිට බදු දී ඇති සිල්ලර වෙළඳසැල් 283ක් සඳහා රු77,222,311 ක හිඟ මුදල් අයකර ගැනීම සඳහා නඩු පැවරීමට ප්‍රමාණවත් සාක්ෂි හාරය තුළ තබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | හාරයේ පවතින වෙළඳසැල් සඳහා මේ වන තෙක් නඩු පැවරීම් සිදු නොකරන ලබන අතර මාස තුනකට වඩා හිඟව පවතින වෙළඳ කුටි සඳහා ලිඛිතව හා වාචිකව දැනුවත් කිරීම් සිදුකරනු ලබන අතර තවදුරටත් ගෙවීම් පැහැර හරින්නේනම් කළමනාකරණ හාරයේ තීරණයන්ට අනුව කටයුතු කරන බව. | -එම - |

| | | | | |
|---|---|---|---|---|
| (v) | අංක 8(ඊ) ඡේදයට | වැටුප්, දීමනා හෝ සම්මත මුදලක් වශයෙන් යම් පරිශ්‍රමිකයක් ලබාගැනීමට භාරකරුවන්ට හිමිකමක් නොමැති බව සඳහන් වුවත් ඒ පිළිබඳව නොසලකා භාරකාර මණ්ඩලය සඳහා පළමුවැන්නා ලෙස නම් කල භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා ද වන ධීවර අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ සාමාජිකයින් 14 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය සඳහා මාසික දීමනා ලෙස එකතුව රු.870,000 ක මුදලක් ගෙවා තිබුණි. | භාරකාර මණ්ඩල රැස්වීම සඳහා සහභාගීවන නිලධාරීන්ගේ ශ්‍රමය හා කාලය කැපකරන බැවින් ද ප්‍රවාහන කටයුතු ඔවුන් විසින්ම ප්‍රසම්පාදනය කරගනු ලබන බැවින් ද එම නිලධාරීන් හට භාර මණ්ඩල අනුමැතිය මත රු.10,000 ක මුදලක් ගෙවීම් සිදුකරන බව. | භාර ඔප්පුව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය | | | |
| | | සමාලෝචිත වර්ෂයේදී රු.114,590,885 ක්වූ අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා වූ ලංසුවට අදාලව ලංසු ඇගයීමේ කාර්ය පටිපාටිය දින 154 කින් අවසන් කළයුතු වුවත් ඒ සඳහා මාස 17 ක් හෙවත් දින 518 ක් ගත කිරීම මඟින් සිය වගකීම නිසි ලෙස ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | එම ප්‍රසම්පාදන කාර්යය ඉතා සංකීර්ණ කාර්යයක් වූ බැවින් ඒ සඳහා දීර්ඝ කාලයක් ගත වූ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා ප්‍රසම්පාදන කාර්යය සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.8 ආයෝජන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපජලය පිරිපහදු යන්ත්‍රාගාරය අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දී භාරය සතු ස්ථාවර තැන්පතු ඇපයට තබා ලංකා බැංකුව වෙතින් රු.මිලියන 100 ක ණය මුදලක් ලබාගෙන තිබුණ ද අපේක්ෂිත කාර්යය ඉටුනොකර භාර මණ්ඩලයේ අනුමැතියක් රහිතව එම මාසයේ දීම එම මුදලින් රු. 76,122,535 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. මේ නිසා භාරයට ලැබිය යුතු පොලිය ද අහිමි වී තිබූ අතර රු.මිලියන 100 ක ණය මුදල සඳහා සියයට 1ක අමතර පොලියක් ද භාරයට ගෙවීමට සිදුවී තිබුණි. | ණය මුදලින් වියදම් නොවූ මුදල නැවත අවශ්‍ය අවස්ථාවලදී ලබා ගැනීම පිණිස නැවත කෙටි කාලීන ආයෝජනවල තැන්පත් කරන ලද බවත් ණය මුදල ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත්කරුට ගෙවීම් කළ නොහැකි බවත් ණය මුදලට ගෙවන අමතර පොලිය අලාභයක් නොවූ භාරයේ වැය බරක් බව. | ආදායම් උත්පාදනය කර ගැනිමට හා පාඩු අවම වන ආකාරයට භාරය කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.29,620,704 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 40,748,886 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 70,369,590ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආදායම අඩුවීම රු.52,186,792 කින් හා පරිපාලන වියදම් රු. 11,399,504 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළඳ සංකීර්ණය පිහිටුවා ඇති වටිනාකම රු.375,141,765 ක්වූ හෙක්ටයාර් 3.1776ක විශාලත්වයෙන් යුත් ඉඩම, ඉඩම් අත්පත් කරගැනීමේ පනත යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් ලබාගත් ඉඩමක් වූ අතර ඉඩම භාරයට අත්පත් කර දීමට අමාත්‍ය මණ්ඩල තීරණයක් මඟින් 2010 ජුනි 03 දින අනුමැතිය ලැබී තිබුණ ද එම ඉඩම අත්පත් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම භාරයට පවරාගෙන ඇති බව. | ඉඩම පවරා ගැනීමට කටයුතු කර අදාල ලිඛිත සාක්ෂිය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කාර්ය මණ්ඩලය අනුමත වී වසර 6 කට ආසන්න වුවත් භාරයේ කළමනාකරු, ගණකාධිකාරි හා අභ්‍යන්තර විගණක යන තනතුරු සඳහා 2021 දෙසැම්බර් 31 වන විටත් බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකර නොතිබුණි. | පළපුරුදු හා කාර්යක්ෂම සේවාවක් ඉටුකරවා ගැනීමට හැකි වන අතර අඩු පිරිවැයකින් අදාල සේවාවන් ඉටුකරවා ගැනීමට භාරයට හැකි වී ඇති බවත් භාරයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් සිදුකරනු ලබන බව. | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආපනශාලාව බඳුදීම සඳහා අත්සන් කර තිබූ ගිවිසුම අනුව නියමිත බදු කුලීය මාස 3 ක් | මේ සම්බන්ධ තවදුරටත් සොයා බලා කටයුතු කරන බව. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත නොගෙවන්නේනම් බදුකරු ඉවත් කළ යුතු වුවත් වර්ෂයට ආසන්න කාලයක් අයකර ගත යුතු රු.54,500,000 ක මුදල අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර බදුකරු ඉවත් කිරිමට ද කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) | භාරය පිහිටුවීමට අදාළව ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව එක් අයෙකුට ලබාදිය හැක්කේ එක් කඩ කාමරයක් වුවද වෙළඳ සංකීර්ණයේ අංක 123,124,125,126,හා 127 දරන සිල්ලර වෙළඳසැල් 05 ක් භාර මණ්ඩල අනුමැතියකින් තොරව 2013 වර්ෂයේ සිට ඇග්‍රෝ ලංකා සමාගම වෙත බදු පදනම මත ලබා දී තිබුණි. | තිදෙනෙකුට වෙළඳසැල් ලබා දී ඇති අතර තැන්පත් මුදල් ගෙවා ඇති බව. | භාරය පිහිටුවීමට අදාළව ඇතිකරගෙන තිබූ ගිවිසුම අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2011 වර්ෂයේ දී රු.මිලියන 34 ක වියදමක් දරා ඉදිකර තිබූ අපජල පිරිපහදු යන්ත්‍රාගාරය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම හා නඩත්තු නොකිරීම නිසා 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනතේ 23A වගන්තිය ප්‍රකාරව මිරිදිය ජල ප්‍රවාහයකට නිකුත් කළ හැකි කාර්මික අපජලයෙහි උපරිම සීමාව ඉක්මවා වෙළඳපල සංකීර්ණය මගින් 2019, 2020 හා 2021 වර්ෂවලදී පමණක් ප්‍රමිතීන්ට පටහැනිව අපජලය ඝණ ලීටර් 297,997 ක් ජලමූලාශ්‍ර වෙත මුදා හැර තිබුණි. | මේ සම්බන්ධව අදාල නිලධාරීන්ගෙන් හා අංශවලින් තොරතුරු ලබාගෙන පිළිතුරු කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ජාතික පරිසර පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙළඳසැල් 128 කින් යුත් සිල්ලර වෙළඳ සංකීර්ණයේ වෙලදසැල්වලින් 64ක් 2012 වර්ෂයේ දී රු.9,625,540 ක් වැයකර තොග වෙළඳසැල් බවට පරිවර්තනය කර තිබුණි. විගණිත දිනය වූ 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම සංකීර්ණයේ වෙළඳසැල් 128 හි අලෙවි කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබූ අතර ව්‍යාපාරික සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි. | මෙම වෙළඳසැල්වල ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීමට කිහිපවරක් ම කටයුතු කරන ලදී. 2021 දෙසැම්බර් මස අවසන් වරට වෙළඳ කටයුතු ආරම්භ කළ ද එය ද අසාර්ථක වුණි. පාරිභෝගිකයන් මෙම ප්‍රදේශයට අඩුවෙන් පැමිණීම හේතුවෙන් ව්‍යාපාරිකයන් ව්‍යාපාරික කටයුතු කිරීමට මැලිකමක් දක්වන අතර නැවත වරක් 2022 ජූලි 05 දිනට ප්‍රථම ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලෙස මෙම පිරිසට දැන්ම් දී ඇති බව. | වෙළඳසැල් සියල්ලම අලෙවි කටයුතු සඳහා යොදා ගෙන ව්‍යාපාරික සැලැස්මක් ද පිළියෙල කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදයෙන් ඇතුළත් කළ මු.රෙ. 877 (1)(ඈ) ඡේදය ප්‍රකාරව පාලනාධිකාරිය විසින් වාර්ෂිකව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ හා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු අතර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතුය. එසේ වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර මු.රෙ. 877 (1) (ඈ) ඡේදයට පටහැනිව අනුමත කරන ලද අයවැයකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ දී එකතුව රු.89,239,510 ක වියදම් භාරය විසින් සිදුකර තිබුණි. | පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයට නඩත්තු උපකරණ ලබා ගැනීම සහ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා කළමනාකරන භාරයේ සභාපතිගේ අනුමැතිය මත සිදුකර ගෙන ඇති අතර අනෙකුත් සියලු කටයුතු කළමනාකරන භාරයේ අනුමැතිය මත සිදුකර ඇති බව | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |